# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය පිළිබඳව විමර්ශනාත්මක විග්‍රහයක්

තිලිනි යූ. මධුසංඛ
පර්යේෂණ මධ්‍යස්ථාන ප්‍රදර්ශිකා
සමාජීයවිද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය
thilinimadushankaa@gmail.com

**සංක්ෂේපය**

කෘෂි කාර්මික අංශය යනු සෑම රටකම ආර්ථිකයේ ප්‍රධාන අංශයකි. වර්තමානය වන විටත් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී කාර්ය භාරයක් කෘෂි අංශය සතුව පවතී. නිදහසින් පසු සමස්තයක් ලෙස ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ දායකත්වය ක්‍රමයෙන් පහළ යාමක් පෙන්වයි. කාර්මික හා සේවා අංශයන්ට සාපේක්ෂව කෘෂි අංශයේ සාපේක්ෂ පහළ යාමක් දක්නට ලැබුනත් නිරපේක්ෂව තවමත් කෘෂි නිමවුම ඉහළ මට්ටමක පවතී. අනෙක් අතට ග්‍රාමීය දිළිඳු ප්‍රජාවට සේවා නියුක්ති අවස්ථා සැපයීමෙහිලා සුවිශේෂ කාර්ය භාරයක් කෘෂි අංශය මඟින් ඉටු කරනු ලබයි. එමෙන්ම විදේශ වෙළඳාම තුළ කාර්මික නිෂ්පාදිතයන් සඳහා වැදගත් තැනක් හිමි වුවද ශුද්ධ අපනයන ඉපයුම් වර්ධනය කිරීමටත් ඒ හරහා ආර්ථික ගැටළු ගණනාවක් අවම කර ගැනීමටත් කෘෂි අංශය හේතු වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කාර්මික අංශය මඟින් දක්වන දායකත්වය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් මෙහිදී සිදු වේ.

**හැඳින්වීම**

ලෝකයේ සෑම රටකම ආර්ථිකයේ ගාමක බලවේගය වන්නේ කෘෂිකර්මාන්තයයි. කෘෂිකර්මාන්තය කාර්මික හා අනෙකුත් සේවා අංශයන්ට අවශ්‍යකරන පදනම සකස් කර දෙන්නා සේම පරිසර හිතකාමී චිරස්ථායී සංවර්ධනයක් ඇති කිරීමෙහිලා ඉතා වැදගත් කොට සැලකේ. සෑම රටකම සංවර්ධන ක්‍රියාවලියේදී කෘෂි අංශයට වැදගත් තැනක් හිමි වේ. වර්තමාන ලෝකයේ මුල් පෙළේ ආර්ථික, කාර්මික හා තාක්ෂණික බලවතුන් බවට පත් වී සිටින ඇමරිකාව, ජපානය වැනි රටවල වර්තමාන අභිවෘද්ධිය පසුපස ඇත්තේ සැලසුම් සහගත කෘෂිකර්මික සංවර්ධනයයි. විශේෂයෙන්ම කෘෂිකර්මික ප්‍රතිපත්තිය කෙරෙහි දැක්වූ සුවිශේෂී අවධානයත්, මූලික වශයෙන් රැකියා හා ජාතික ආදායම් ඉහළ නැංවීමේ ප්‍රධාන මූලාශ්‍රය බවට කෘෂිකර්මාන්තය පත් කිරීමත් මෙහිදී ඉතා වැදගත් වේ. නමුත් වර්තමානය වන විට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ දායකත්වය ක්‍රමයෙන් හීන වෙමින් පවතී. එසේ වුවත් ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල් ප්‍රමුඛ සංවර්ධනය වෙමින් රටවල් කේන්ද්‍ර කොටගනිමින් වර්ධනය වන ජනගහනයට අවශ්‍ය ආහාර හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීමෙහිලා කෘෂිකාර්මික අංශය පුළුල් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. එය ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වන රටවල් තුළ මෙන්ම අනෙකුත් සංවර්ධිත රටවල් තුළද ප්‍රායෝගිකව දක්නට ලැබෙන්නකි. Athukorala, P. & Jayasuriya, S. 1994)

ශ්‍රී ලංකාව සලකා බැලූ විට එය වසර 2500කට වඩා වැඩි ඓතිහාසික උරුමයක් පවතින ස්වභාවයෙන්ම කෘෂිකාර්මික රටකි. ගොවිතැන, ස්වයංපෝෂිත බව පිළිබඳ සලකා බැලීමේදී පෙරදිග ධාන්‍යාගාරය ලෙස හැඳින්වීමට තරම් අභිමානවත් කෘෂිකාර්මික ඉතිහාසයක් ලංකාව තුළ පැවතුණි. දීර්ඝ කාලයක් තිස්සේ ලංකාව තුළ පැවතියේ සාම්ප්‍රදායික යැපුම් කෘෂිකාර්මික රටාවකි. එම සාම්ප්‍රදායික කෘෂිකාර්මික රටාව වෙනසකට ලක් වන්නේ යුරෝපා ජාතීන්ගේ ආගමනයත් සමඟයි. විශේෂයෙන්ම යුරෝපීය ජාතිකයින්ගේ පැමිණීමෙන් පසු මෙරටට හඳුන්වා දෙන ලද වතු වැවිලි වගාව ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෙනස්කම් ගණනාවක් ඇති කිරීමට හේතු විය. සාම්ප්‍රදායිකව මෙරට පැවති වී වගාව හා අනෙකුත් අතුරු භෝග වගාවන්ට අමතරව තේ, රබර්, පොල් වැනි වතු වැවිලි වගාවන්ද සුළු අපනයන භෝග වගාවන්ද කෘෂි අංශය යටතේ ව්‍යාප්ත කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් විය.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය යටතේ ඇරඹි වතුවැවිලි ආර්ථිකය නිදහස ලැබීමෙන් අනතුරුව ද ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය ලෙස ආර්ථික සංවර්ධනය ක්‍රියාවලියෙහි සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ලදී. වතුවැවිලි ආර්ථිකය ඇරඹීමත් සමඟ එතෙක් සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක වූ යැපුම් කෘෂිකාර්මික අංශය තව දුරටත් ග්‍රාමීය ආර්ථිකයේ අවශ්‍යතා සපුරාලීම සිදු කළ අතර නවීන අංශය හෙවත් වැවිලි අංශය විවිධ නව්‍යතාවයන්ගෙන් සමන්විත වී කැපී පෙනෙන අංශයක් වශයෙන් ඉදිරියට ගමන් කළේය. ඒ අනුව කෘෂිකාර්මික අංශය මෙරට දළ දේශීය නිෂ්පාදිතය, සේවානියුක්තිය, විදේශ විනිමය ඉපයීම කෙරෙහි දායක වන ප්‍රධාන අංශයක් වශයෙන් ව්‍යාප්ත විය. (හෙට්ටිආරච්චි, 1998)

**දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය**

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශයේ දායකත්වය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී. නිදහස ලැබීමෙන් පසු කාලයේ සිට මෑත කාලය දක්වා දශක හයකට වැඩි කාලයක් තුළ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශයේ දායකත්වය ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතී. 1950 ගණන් වන විට ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 50% ක් පමණ ප්‍රාථමික කෘෂිකාර්මික අංශයේ දායකත්වයෙන් යුක්ත වූ අතර එය තේ, පොල්, රබර් යන ප්‍රධාන වාණිජ භෝග තුනට හා වී වගාවට පමණක් සීමා විය. එසේම එම කාලය තුළ විදේශ වෙළඳාම, ප්‍රවාහනය, බැංකු, රක්ෂණය ආදී සේවා අංශයට අයත් කටයුතු ද කෘෂිකාර්මික නිෂ්පාදිතයන් හා සමීපව සම්බන්ධව පැවතුණි. 1960 ගණන් වල සිට දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය ක්‍රමයෙන් පහත වැටීමක් දක්නට ලැබේ. 1960 ගණන් වලදී එය 38% ක් පමණ වූ අතර මෙම කාලයේ කෘෂි අංශය තුළ දේශීය කෘෂිකර්මයේ දායකත්වය වැවිලි කෘෂි අංශයේ දායකත්වය මෙන් සිව් ගුණයකට වඩා විශාල විය. වැවිලි භෝග වලට සාපේක්ෂව වී වගාව විශාල ලෙස වර්ධනය වීම එයට හේතුවයි. නිදහස ලැබීමෙන් පසු රට සහලින් ස්වයං පෝෂිත කිරීමට සෑම රජයක්ම උත්සහ දැරීම, වාරිමාර්ග පහසුකම් දියුණු කිරීම, සහනාධාර හා උපකාරක සේවා ව්‍යාප්ත කිරීම, පර්යේෂණ කටයුතු, ඉඩම් ජනාවාසකරණය, සහතික මිල ක්‍රමය, යන්ත්‍රෝපකරණ භාවිතය ආදිය වී නිෂ්පාදනය පුළුල් වීම කෙරෙහි බලපාන ලදී. (පොඩිමැණිකේ, 2004)

තේ, පොල්, රබර් යන ප්‍රධාන වතුවැවිලි වගා නිෂ්පාදනයන් සලකා බැලීමේදී 1950 ගණන් වල සිට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතට දක්වන දායකත්වය ක්‍රමයෙන් පහළ යාමක් දක්නට ඇත. 1950-1960 කාලයේදී දස ලක්ෂ 228 ක් වූ තේ නිෂ්පාදනය 1965 වන විට ද.ල. 200 ක් දක්වා අඩු විය. රබර් හා පොල් නිෂ්පාදන ආශ්‍රිතවද වරින් වර අනපේක්ෂිත උච්චාවචනයන් ඇති වුවත් සාපේක්ෂව ඉහළ නිෂ්පාදන මට්ටමක් පැවතිනි. 1950-1960 කාලයේදී ද.ල. 96 ක් වූ රබර් නිෂ්පාදනය 1960-1970 කාලය වන විට නිමවුම ද.ල. 160ක් දක්වා වර්ධනය විය. ඒ අනුව 1970 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 28.3% ක් කෘෂි අංශය මගින් සැපයූ අතර ඉන් 7.2 ක් වී නිෂ්පාදනයෙන්ද, 4.1 ක් පොල් නිෂ්පාදිතයන්ගෙන්ද, 3.2 ක් තේ හා 1.7ක් රබර් නිෂ්පාදිතයන්ගෙන්ද සමන්විත විය. (උදයකාන්ත, 2007)

කෙසේ නමුත් 1977 දී හඳුන්වා දෙන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ එතෙක් පැවති ආර්ථික ක්‍රියාකාරීත්වයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති විය. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ සාපේක්ෂ දායකත්වය පහළ යමින් කාර්මික හා සේවාවන්හි සාපේක්ෂ වැදගත්කම ඉහළ යාමක් සිදු විය. එම තත්ත්වය තුළ 1977න් පසුව දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශය මගින් දැක්වූ දායකත්වන පහත ආකාරයට පෙන්වා දිය හැකිය.

**වගු අංක 1 : දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ දායකත්වය (පවත්නා සාධක මිල අනුව)**

| වර්ෂය | 1980 | 1985 | 1990 | 1995 | 2000 | 2008 | 2010 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි වන දැව හා ධීවර | 27.5 | 27.6 | 26.3 | 23.0 | 19.8 | 12.1 | 11.9 | 10.8 | 10.1 |
| කෘෂිකර්මය | 22.8 | 24.6 | 22.4 | 17.8 | 15.7 | 10.9 | 10.7 | 9..5 | 8.8 |
| තේ | 2.6 | 3.6 | 3.0 | 1.2 | 1.3 | 1.2 | 1.1 | 0.9 | 0.9 |
| රබර් | 1.4 | 0.8 | 0.5 | 0.6 | 0.2 | 0.5 | 0.3 | 0.2 | 0.1 |
| පොල් | 3.8 | 2.2 | 1.6 | 1.5 | 1.2 | 1.4 | 1.1 | 0.8 | 0.8 |
| ඕ | 6.1 | 6.3 | 5.1 | 3.6 | 2.8 | 1.8 | 1.8 | 1.6 | 0.3 |
| දැව ආදී..... | 1.9 | 1.7 | 0.1 | 2.3 | 1.5 | 0.6 | 0.4 | 0.4 | 0.5 |
| ඍෂවර | 2.8 | 1.9 | 1.9 | 2.7 | 2.6 | 1.1 | 1.2 | 1.3 | 1.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

ඉහත වගුවට අනුව 1990-2005 කාලය තුළ පමණක් තේ, රබර්, පොල් වගා අංශයෙන් කෘෂි අංශයට දැක්වූ දායකත්වය 45%කින් අඩු වී ඇත. තේ වගා අංශය 47%කින් ද රබර් වගා අංශය 30%කින් ද පොල් වගා අංශය 47%කින් ද අඩු වී ඇත. නිරපේක්ෂව කෘෂි නිෂ්පාදනය ඉහළ මට්ටමක තිබියදී ද.දේ.නි. තුළ කෘෂි අංශ දායකත්වය අඩු වී ඇත්තේ කාර්මික හා සේවා අංශයන්හි සාපේක්ෂ වැදගත්කම ඉහළ යාම හේතුවෙනි.

කෘෂිකාර්මික අංශයේ වර්ධනය කෘෂි අංශයේ සංවර්ධනයට පමණක් නොව කාර්මික අංශයේ සංවර්ධනයට ද ප්‍රධාන වශයෙන් බලපාන අතර සමස්තයක් ලෙස එය ආර්ථික වෘද්ධියට හේතුවකි. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමෙන් පසුව කෘෂි අංශයෙන් කාර්මික අංශයට සිදු වූ දායකත්වය 32% කින් පමණ වැඩි වී ඇත. විශේෂයෙන් කෘෂි නිෂ්පාදන කේන්ද්‍ර කොටගත් කාර්මික නිෂ්පාදන පුළුල් වීම හේතුවෙන් කෘෂි අංශයෙන් කාර්මික අංශයට දක්වන දායකත්වය වර්ධනය විය. එය පහත වගුවෙන් දැක්වේ.

**වගු අංක 2 : නිෂ්පාදන අංශයට දැක්වූ දායකත්වය ද.දේ.නි. %ක් ලෙස**

**(ස්ථාවර සාධක මිල අනුව)**

| වර්ෂය | නිෂ්පාදන අංශයට දැක්වූ දායකත්වය |
|---|---|
| 1990 | 2.5 |
| 1995 | 2.2 |
| 1998 | 2.2 |
| 2000 | 2.1 |
| 2003 | 1.8 |
| 2005 | 1.7 |
| 2008 | 1.4 |
| 2010 | 1.5 |

| | |
|---|---|
| 2013 | 1.9 |
| 2014 | 1.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

**සේවානියුක්තිය කෙරෙහි කෘෂි අංශයේ දායකත්වය**

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගෙන් 90%ක් පමණ තවමත් කෘෂි ආර්ථිකය තුළ ජීවත් වේ. මෙනිසා කෘෂි කර්මය, සත්ව පාලනය, ධීවර යන අංශයන්හි සේවා නියුක්ත ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී. සේවානියුක්තිය උත්පාදනය කිරීමේ මූලාශ්‍රයක් ලෙස 1950 ගණන් වල සිට 1980 දක්වා කාලය තුළ කෘෂි අංශය ඉතා වැදගත් තැනක් ගෙන තිබුණි. 1953 වන විට කෘෂි අංශයේ සේවානියුක්තිය 53% ක් වූ අතර එය 1963 දී 52.9%ක් හා 1971 දී 50.4%ක් විය.

1977 ආර්ථික ලිහිල්කරණයත් සමඟ කෘෂි අංශයේ සේවානියුක්තිය පහළ වැටීමක් සිදු වී ඇත. 1953 සිට 1996 කාලය තුළ වැවිලි අංශයේ සේවානියුක්තිය 29% සිට 20% දක්වා අඩු වී ඇතත් එය දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය පහත වැටුන තරම් ප්‍රමාණයට වඩා අඩු අගයකි. 1980 පමණ වන විට 51% ක් පමණ වූ එය 1995 වන විට 36% ක් දක්වා ද මෑත කාලය වන විට 29% ක් දක්වා ද වෙනස් වී ඇත. ආර්ථිකයේ සමස්ත සේවානියුක්තියට කෘෂි අංශයේ දායකත්වය හා එහි වෙනස් වීම පහත ආකාරයට පෙන්වා දිය හැක.

**වගු අංක 3 : කෘෂි අංශයේ සේවානියුක්තිය**

| වර්ෂය | සේවානියුක්තිය |
|---|---|
| 1953 | 53 |
| 1963 | 52.9 |
| 1971 | 50.4 |
| 1982 | 51.2 |
| 1990 | 47.7 |
| 1995 | 36.8 |
| 2000 | 34.9 |
| 2005 | 32.8 |
| 2010 | 31.7 |
| 2013 | 29.6 |
| 2014 | 28.5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

කෘෂි අංශයේ සේවානියුක්තියෙන් වැඩි ප්‍රමාණයක් ඌන සේවානියුක්තියන් ලෙසට සැලකේ. ඉහත වගුවට අනුව ප්‍රතිශතයක් ලෙස කෘෂිකාර්මික අංශයේ සේවානියුක්තිය ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබේ. හේතුව වන්නේ කෘෂි අංශයේ ශ්‍රමය එම අංශයෙන් පිටතට ඇදී යාමයි. කාර්මික හා සේවා අංශයන්හි ව්‍යාප්තියත් සමඟ කෘෂි සේවානියුක්තියෙන් කොටසක් සේවා අංශයටත් කාර්මික අංශයේ ගොවිපළ නොවන ආදායම් මාර්ග වලට යොමු වීමයි. නමුත් ආදායම් උත්පාදන මූලාශ්‍රයකට වඩා සේවානියුක්ති උත්පාදන මූලාශ්‍රයක් ලෙස කෘෂි අංශය වර්තමානයේද වැදගත් තැනක් හිමිකරගෙන ඇත.

**විදේශ ඉපයුම් කෙරෙහි කෘෂි අංශයේ දායකත්වය**

දේශීය වශයෙන් අපනයන ප්‍රවර්ධනය කර ගැනීමටත් ශුද්ධ අපනයන ඉපයුම් වර්ධනය කිරීමටත් කෘෂි කාර්මික අංශය ඉතා වැදගත් වේ. 1950 ගණන් වලදී දේශීය අපනයන ඉපයුම් වල ඉහළම අගය කෘෂි අංශය සතු විය. මුළු අපනයන වලින් කෘෂි කාර්මික අපනයන වල දායකත්වය 94% ක් පමණ විය. එහිදී තේ, රබර්, පොල් වැවිලි භෝග අංශයෙන් දැක්වූ දායකත්වය ඉහළ අගයක් ගනී. 1970 පමණ වන විට මෙහි සුළු අඩුවීමක් පෙන්වන අතර එය 92%ක් විය.

නමුත් 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ ආනයන අපනයන රටාව වෙනස් කම් ගණනාවක් ඇති වේ. එය පහත ආකාරයට පෙන්වා දිය හැක.

**වගු අංක 4 : ශ්‍රී ලංකාව් අපනයන ව්‍යුහයේ වෙනස්වීම**

| අංශය | 1980 | 1985 | 1990 | 1995 | 2008 | 2010 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි අපනයන | 60 | 53 | 35 | 22 | 22.8 | 24.6 | 25 | 25.1 |
| කාර්මික අපනයන | 18 | 39 | 49 | 71 | 75.7 | 74.3 | 74 | 74.2 |
| වෙනත් අපනයන | 22 | 8 | 16 | 7 | 1.5 | 1.1 | 1 | 0.7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

මෙම ව්‍යුහාත්මක වෙනස් වීම් සමඟ මුළු කෘෂි අපනයන ඉපයුම් වල වටිනාකම ක්‍රමයෙන් පහළ යාමක් හඳුනාගත හැක. එය පහත වගුව තුළින් පෙන්නුම් කළ හැක.

**වගු අංක 5 : ශ්‍රී ලංකාවේ කෘෂි අපනයන ව්‍යුහය**

| බෝගය | 1991 | 1995 | 2000 | 2002 | 2004 | 2005 | 2008 | 2010 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| තේ | 21.8 | 12.6 | 12.6 | 14.0 | 12.8 | 12.8 | 15.6 | 16.6 | 14.8 | 14.8 |
| රබර් | 3.2 | 2.9 | 0.5 | 0.5 | 0.9 | 0.74 | 1.5 | 2.1 | 0.7 | 0.7 |
| පොල් | 3.2 | 2.7 | 2.2 | 1.8 | 1.9 | 1.8 | 2.1 | 2.1 | 2.0 | 2.0 |
| එකතුව | 28.1 | 18.2 | 18.2 | 16.3 | 15.6 | 15.3 | 19.2 | 20.8 | 17..5 | 17.5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

ඉහත තොරතුරු අනුව ක්‍රමයෙන් කෘෂිකාර්මික අපනයන ඉපයුම් වල වටිනාකම පහළ යාමක් පෙන්නුම් කෙරේ. මෙලෙස මුළු කෘෂි අපනයන ඉපයුම් වල වටිනාකම පහළ යාමක් සිදු වූයේ මෑත කාලීන වශයෙන් දළ කාර්මික අපනයන ඉපයුම් වර්ධනය වීම හේතුවෙනි. දළ කාර්මික අපනයන ඉපයුම් වල වැදගත්කම ඉහළ අගයක් ගත්ත ද ඒවායේ ශුද්ධ ඉපයුම් වටිනාකම අඩු මට්ටමක පවතී. එයට සාපේක්ෂව ශුද්ධ කෘෂි කාර්මික අපනයන ඉපයුම් වල වටිනාකම ඉහළ මට්ටමක පවතී. මෙනිසා ලංකාවේ ශුද්ධ අපනයන ඉපයුම් වර්ධනය කිරීමෙහිලා කෘෂි අංශය ඉතා වැදගත් වේ. නමුත් මෙහිදී කෘෂි අපනයන වල මිල ගණන්හි අනවශ්‍ය උච්චාවචනයන් ඇති වීම වළක්වා ගනිමින් අපනයන සඳහා ස්ථාවර මිලක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර තත්වයෙන් හා ගුණත්වයෙන් උසස් කෘෂි භාණ්ඩ නිපදවා ඒවා සඳහා වෙළඳපොළ ප්‍රසාරණය කර ගැනීම වැදගත් වේ. එලෙස කෘෂි භාණ්ඩ අපනයන වර්ධනය හරහා ශුද්ධ අපනයන ඉපයුම් වර්ධනය කර ගැනීම ගෙවුම් ශේෂ හිඟය පියවා ගනිමින් ගෙවුම් ශේෂ ප්‍රශ්නය විසඳා ගැනීමටත් විදේශීය ණය ගැති බව අවම කර ගැනීමටත් වැදගත් වේ.

**නිගමන**

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකාර්මික අංශයේ දායකත්වය සාපේක්ෂව පහත වැටී ඇත. නමුත් නිරපේක්ෂව කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගේ වර්ධනයක් පවතී. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගෙන් වැඩි කොටසක් තවමත් කෘෂිකාර්මික අංශය තුළ කටයුතු කරන අතර මේ නිසා කෘෂි අංශයේ සේවා නියුක්තිය ඉහළ අගයක් ගනී. කාර්මික අපනයන වල මුළු අපනයන අගය ඉහළ අගයක් ගනු ලැබුව ද ශුද්ධ අපනයන ආදායම තුළ කෘෂිකාර්මික නිෂ්පාදන මඟින් ලබා දෙන ආදායම් වටිනාකම ඉහළ අගයක් ගනී. ඉහත තත්ත්වයන් අනුව තව දුරටත් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය තුළ කෘෂිකාර්මික අංශය සතුව ඉහළ කාර්ය භාරයක් පවතින බව හඳුනාගත හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Athukorala, P. & Jayasuriya, S. (1994) Macro Economic Policies, Crises and Growth in Sri Lanka 1969-90, The World Bank.

හෙට්ටිආරච්චි, උපාලි, (1998) ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය, කතෘ ප්‍රකාශන, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

පොඩිමැණිකේ, ප්‍රේමා, (2004) ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය, කැලණි ප්‍රින්ටර්ස්, මාකොල, කිරිබත්ගොඩ.

උදයකාන්ත, සමන්, (2007) සංවර්ධනය අභියස කෘෂිකර්මාන්තය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, 675, කුලරත්න මාවත, කොළඹ 10.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා